**එම්. යූ. එම්. අලි සබ්රි, පා. ම.**
**எம். யூ. எம். அலி ஸப்ரி, பா. உ.**
**M. U. M. Ali Sabry, PC, M.P.**
**විදේශ කටයුතු අමාත්‍ය**
**வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்**
**Minister of Foreign Affairs**


# නිදහස් දින පණිවිඩය

නිදහසේ 76 වන සංවත්සරය සමරන අද දිනයේ, මෙම සන්ධිස්ථානය වෙන කවරදාටත් වඩා වැදගත්කමක් දරයි.

නිදහසින් පසු ජාතියක ගමනට ආර්ථික ස්වාධීනත්වය අත්‍යවශ්‍ය වේ. මීට වසරකට පෙර අප මුහුණ දුන් දැඩි ආර්ථික අර්බුදය හමුවේ, ආර්ථිකය ළඟා කරගත් වර්තමාන ප්‍රතිසාධනය සහ වර්ධනය ළඟා කරගත නොහැකි්කක් සේ පෙණුනි. මෙම ප්‍රතිසාධන මාවතට අප ගෙන එනු ලැබුවේ යහපත් නායකත්වයේ සහ කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සංයෝජනය යි. විදේශ කටයුතු අමාත්‍යාංශය සහ විදේශයන්හි අපගේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල, මෙම ක්‍රියාවලිය සඳහා දායක වී ඇත. සම්පූර්ණ ප්‍රතිසාධන කරා ළඟා වීම සඳහා ශ්‍රී ලංකාවට තවමත් දිගු ඉදිරි ගමනක් පැවතිය ද, දුෂ්කරතා හමුවේ අප විසින් ප්‍රදර්ශනය කර ඇති අප්‍රතිහත ධෛර්ය පිළිබඳ සලකා බලන කළ අපගේ ඉදිරි ගමන පිළිබඳව සුබවාදීව සිතිය හැක.

ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම, මානව හිමිකම් සහ නීතියේ ආධිපත්‍යය සඳහා ශ්‍රී ලංකාව කැපවී සිටී. අවස්ථා සහ සම්පත් සඳහා සමාන ප්‍රවේශයක් ලබා දීම ප්‍රවර්ධනය කිරීම සහ පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසම සහ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ කටයුතු පිළිබඳ කාර්යාලය (OOSLA) වැනි ආයතන පිහිටුවීමෙහි ලා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන ලද බව සැලකිය යුතු කරුණකි. දේශගුණික විපර්යාස, ආර්ථික සංවර්ධනය සහ සාමය වැනි ගෝලීය ගැටළු විසඳීම සඳහා ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික කටයුතුවල සක්‍රියව නිරත වෙමින් ජාත්‍යන්තර සහයෝගීතාව පිණිස ශ්‍රී ලංකාව කැපවී සිටී. එය රාජ්‍යතාන්ත්‍රික සබඳතා වර්ධනය කිරීම, කලාපීය ස්ථාවරත්වයට දායක වීම සහ සහාග වගකීම් තහවුරු කිරීම අරමුණු කරයි. ද්විපාර්ශ්වික සංචාර සහ උපදේශන, වැඩිදියුණු කළ දේශපාලන හා ආර්ථික සබඳතා පෝෂණය කිරීම තුළින් අපි ගෝලීය සබඳතා වර්ධනය කර ඇත. ඉන්දියානු සාගර වටද්දර රටවල සංගමයේ නායකත්වය ද ශ්‍රී ලංකා විසින්ව භාර ගන්නා ලදී. ඉදිරි වසර තුළදී ශ්‍රී ලංකාව මෙම බැඳීම් වඩාත් ශක්තිමත් කර වර්ධනය කළ යුතු වේ.

කෙසේ වෙතත්, අපගේ ජනතාවගේ විවිධත්වය එක් සුසංයෝගී සහ ශක්තිමත් ශ්‍රී ලාංකික ජාතියක් බවට පත් කිරීම: යන අපගේ අතිශය වැදගත් අරමුණ සලකා බැලීමේදී අප තවමත් එය අත්පත් කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව මතක තබා ගත යුතුය. පසුගිය වසර 76 තුළ අපි අපගේ වෙනස්කම්වලට ප්‍රමුඛත්වය ලබා දීම තුළින් සහ සමාජ දේහය මත එම වෙනස්කම්වලට ආධිපත්‍යය දැරීමට ඉඩ දීම හේතුවෙන්, පසුව එය අපව බැඳ තබන පොදුත්වයන් පෝෂණය කිරීමට අසමත් විය. අපගේ සැබෑ හැකියාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා, අපි මෙම දුෂ්කර නමුත් විචක්ෂණශීලී ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ අඛණ්ඩව සිදු කරගෙන යන අතර භේදකාරී ප්‍රතිපත්තිවලට එරෙහි වෙමින් අපගේ විවිධත්වය තුළ ඇති එකමුතුකම වැළඳ ගත යුතු වේ.

සියලුම ශ්‍රී ලාංකිකයින්ට ප්‍රීතිමත් නිදහස් දිනයක් ප්‍රාර්ථනා කරමි.

එම්.යූ.එම්. අලි සබ්රි, ජනාධිපති නීතිඥ, පා.ම.
විදේශ කටයුතු අමාත්‍ය
2024 පෙබරවාරි 4 වන දින


කාර්යාලය/அலுவலகம்/Office: +94 - 11-2430221, +94-11-2445498 ෆැක්ස්/பெக்ஸ்/Fax No +94-11-2430222
වෙබ් අඩවිය/வலைத்தளம்/Website : www mfa gov lk ඊමේල්/மின்னஞ்சல்/Email: fmo@mfa gov lk
විදේශ කටයුතු අමාත්‍යාංශය, ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01, ශ්‍රී ලංකාව.
வெளிநாட்டு அலுவல்கள் அமைச்சு, குடியரசுக் கட்டிடம், கொழும்பு 01, இலங்கை.
Ministry of Foreign Affairs, Republic Building, Colombo 01, Sri Lanka